# දෙමළ ජාතිවාදයේ නෙයියාඩම්

දෙමළ ජාතිවාදය තවත් වටයකට සූදානම් ය. අද දෙමළ ජාතිවාදය ඉදිරියට ගෙනයෑම සඳහා බ්‍රිතානීන් ඇමරිකානුවන් හා සෙසු බටහිරයන් යොදාගන්නේ විසුරුණු දෙමළ ජනයා, සුපුරුදු පරිදි රාජ්‍ය නොවන සංවිධාන හා ඊනියා උගතුන් ය. මේ වටයේ වැඩිදුර යෑමට පෙර ඔවුන් ජනතාව ඉදිරියේ හෙළිදරව් කර සුණුවිසුණු නොකළහොත් වැඩිකල් යෑමට පෙර නැවතත් ප්‍රභාකරන් කෙනකු_බිහිකර පොදුවේ රටටත් විශේෂයෙන් දෙමළ ජනයාටත් විනාශයක් අත්කර දෙනු ඇත.

පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේ ප්‍රතිඵල ඉතා පැහැදිලි ය. සිංහලයන් ජාතිකත්වයට තුනෙන් දෙකක ජයග්‍රහණයක් හිමිකර දී ඇත. ඒ ජයග්‍රහණය අප නම් බලාපොරොත්තු නොවුවක් නො වේ. අපි ඒ බව පැහැදිලිව ම පසුගිය සතියේ විස්තර කෙළෙමු. එහෙත් ඇතැම් පඬියන් ඒ ගැන සිතන්නේ ජේ ආර් ජයවර්ධන කිසි දිනෙක නොසිතූ දෙයක් සිදුවීමක් ලෙස පමණ ය. මේ පඬියන් ඒ ගැන සිතීමට බොහෝ කලකට පෙර සිංහලයන්ගේ ඡන්දවලින් පමණක් වුව ද සමානුපාතික ක්‍රමය යටතේ ම ආණ්ඩු පිහිටුවිය හැකි බව කියා සිටියෙමු. ජේ ආර් හා චන්ද්‍රිකා වැන්නන් නොසිතූ නිසා අනෙක් අයට එසේ සිතීමට නොහැකි වන්නේ යැයි සිතන්නෝ පඬියෝ ම වෙති. ඉතා විශේෂ අවස්ථා යටතේ තුනෙන් දෙකේ ජයග්‍රහණයක් වුව ද ලබාගැනීමට ඉඩකඩ ඇති බව අපි කීවෙමු. එබැවින් එ ජ නි ස සමානුපාතික ක්‍රමය යටතේ ආසන 144ක් ලබාගැනීම අපට පුදුමයක් නො වී ය. අප කණගාටු වූයේ සංධානයට තුනෙන් දෙකක් ලබාගැනීමට නොහැකිවීම ගැන ය. මැතිවරණ ව්‍යාපාරයෙහි දී නාගරික මහප්පරාණ ජාතිකවාදීන්ට සරත් ෆොන්සේකාගේ පාවාදීම් නිසි අයුරින් පැහැදිලි කෙළේ නම් ජ වි පෙ ෆොන්සේකා හවුලට ලැබුණු මන්ත්‍රී ධ හතෙන් හයක්වත් සංධානයට ලබාගැනීමට තිබිණි. අද පැහැදිලිව ම සිංහල ජාතිවාදීන් ප්‍රධාන වශයෙන් ම ඇත්තේ ශ්‍රී ල නි ප සමග ය. සිංහල ජාතිකත්වයේ අනෙක් පක්ෂ සංධානයෙහි ගිලී ඇත. එහෙත් ශ්‍රී ල නි පක්ෂයට දැන් සියල්ල සම්පූර්ණ යැයි කියා විවේක ගැනීමට නො හැකි ය. නැවතත් වරක් ශ්‍රී ල නි ප දෙමළ ජාතිවාදය ඉදිරියේ දණගැස්සවීමට ල ස ස ප සහ කො ප පමණක් නොව ඇතැම් චන්ද්‍රිකාවාදී ශ්‍රී ල නි පාක්ෂිකයන් ද උත්සාහ දරණු ඇත. කිසි දිනෙක කොටි පැරදවිය නොහැකි යැයි කී චන්ද්‍රිකාවාදීන් කිහිප දෙනකු මෙවර පාර්ලිමේන්තුවට තේරී පත්වී ඇති බව අමතක නොකළ යුතු ය. අප මේ සියළු උත්සාහ පරාජය කළ යුතු ය. අද මෙරට ඊනියා මාක්ස්වාදී වමක් නැත. ඇත්තේ වම නමින් හොල්මන් කරන ඊනියා පක්ෂ පහේ සංධානයකි. මේ සංධානයෙන් තේරී පත් වී ඇත්තේ මන්ත්‍රීන් තුන්දෙනකු පමණ ය. ඔවුන් ද තේරී පත්වූයේ එ ජ නි සංධානයෙන් තරග කළ බැවිනි. ඔවුනට මනාප ලැබුණේ පෞද්ගලික ජනප්‍රියතාව හේතුකොටගෙන මිස පක්ෂ ප්‍රතිපත්ති නිසා නො වේ. පක්ෂ ප්‍රතිපත්ති මත දිනන්නේ නම් තිස්ස විතාරණ හා ඩිව් ගුණසේකර යන නායකයන්ට තරග කර දිනිය හැකි විය යුතු ය. පෞද්ගලික ජනප්‍රියතාවක් ද නැති ඔවුන් මන්ත්‍රීවරුන් වන්නේ ජාතික ලැයිස්තුවෙනි. අඩුම තරමින් දිනේශ් ගුණවර්ධන, චම්පික රණවක හා විමල් වීරවංශ යන ජාතික පක්ෂවල නායකයන්ට එකම දිස්ත්‍රික්කයේ තරග කර මනාපවලින් පළමු හතරදෙනා අතරට පැමිණීමේ ශක්තිය ඇත. (දුමින්ද සිල්වාගේ ජයග්‍රහණය හුදු තොරොම්බල් දේශපාලනයේ ප්‍රතිඵලයකි) අද වමේ පක්ෂ යනු ජාතිකත්වයේ පක්ෂ මිස මාක්ස්වාදයේ පක්ෂ නො වේ. යම් හෙයකින් ශ්‍රී ල නි ප ඊනියා වම ඉදිරියේ දණ නමා ජාතිකත්වයෙන් ඉවත්වුවහොත් එය ශ්‍රී ල නි පක්ෂයේ ද අවසානය වනු ඇත. ජාතිකත්වය ඒ පක්ෂය වෙනුවට වෙනත් පක්ෂයක් සොයාගනු ඇත. යටත්විජිත විරෝධී අරගලය අද බද්ධවන්නේ ජාතිකත්වය සමග මිස මාක්ස්වාදය සමග නො වේ.

අම්පාර තිරිකුණාමලය නුවරඑළිය වැනි දිස්ත්‍රික්කවලින් සිංහල මන්ත්‍රීන් සංධානයට එක්වීම මෙවර කැපී පෙනෙන ලක්ෂණයකි. ව්‍යාජ සංඛ්‍යා ආශ්‍රයෙන් පුම්බනු ලැබූ දෙමළ ජාතිවාදී මන්ත්‍රී සංඛ්‍යාව මෙවර අඩු වී ඇත. සිංහලයන් විශාල වශයෙන් ජාතිකත්වයට නැඹුරුවීමත් ඔවුන් සිංහල අපේක්ෂකයන්ට මනාප ලකුණු කිරීමත් එයට හේතුව වෙයි. යාපනය වන්නි ත්‍රිකුණාමල අම්පාර හා මඩකලපු දිස්ත්‍රික්කවලින් යම් මුස්ලිම් හා දෙමළ ඡන්ද සංඛ්‍යාවක් ද සංධානයට ලැබී ඇත. ඒ හොඳ ප්‍රවණතාවකි. පසුගිය ජනාධිපතිවරණයට වඩා වැඩි ඡන්ද ප්‍රතිශතයක් පාර්ලිමේන්තු මැතිවරණයේ දී සංධානයට ඉහත සඳහන් දිස්ත්‍රික්කවලින් ද ලැබීම ශ්‍රී ල නි පක්ෂයේ ජයග්‍රහණයකි. උතුරු වසන්තය හා නැගෙනහිර නවෝදය ක්‍රමයෙන් දෙමළ හා මුස්ලිම් ජනතාවට ආකර්ෂණයක් වෙමින් පවතියි. උතුරේ එ ජ නි ස ලැබූ වැඩි ප්‍රතිශතය ඩග්ලස් දේවානන්දට බැරකිරීමට ඇතැම් සිංහල විරෝධී උගතුන්ට අවශ්‍ය වී ඇත. පසුගිය ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මැතිවරණය අතර දෙමළ ජනයා ආකර්ෂණය කිරීමට දේවානන්ද අමුතුවෙන් කර ඇත්තේ කුමක් ද?

© Prof. Nalin De Silva

අද නැවතත් සම්බන්ධන්ලා දෙමළ ජාතිවාදී දේශපාලනයේ යෙදෙති. නැවතත් අර කසිකබල් තර්කය සිංහල විරෝධී උගතුන් අත තොරොම්බල් වෙයි. (දුමින්ද සිල්වාගේ දේශපාලනය හා මොවුන්ගේ දේශපාලනය අතර ගුණාත්මක වෙනසක් නැත) ඔවුන්ගේ කසිකබල් තර්කය නම් චෙල්වනායගම් මගින් ඉදිරිපත් කෙරුණු දෙමළ ජනයාගේ ඊනියා සාධාරණ ඉල්ලීම්වලට විසඳුම් දීමට සිංහල දේශපාලනඥයන් අසමත් වූ බැවින් ප්‍රභාකරන් කෙනකු බිහි වූ බව ය. මෙතරම් පට්ටපල් බොරුවක් ඉතිහාසයේ තවත් කියවී නැත. ප්‍රභාකරන් බිහිවූයේ ම චෙල්වනායගම් දේශපාලනයේ ප්‍රතිඵලයක් වශයෙනි. චෙල්වනායගම් යනු ජී ජී පොන්නම්බලම්ගේ දෙමළ කොංග්‍රස් දේශපාලනයේ ප්‍රතිඵලයකි. දෙමළ කොංග්‍රස් දේශපාලනය එයට කලින් තිබූ පොන්නම්බලම් රාමනාදන් හා පොන්නම්බලම් අරුනාශලම් දෙබෑයන්ගේ දෙමළ ජාතිවාදී දේශපාලනයේ ප්‍රතිඵලයකි. ඔවුන් පිටුපස සිටියේ සිංහලයන්ට විරුද්ධව දෙමළ ජාතිවාදය බිහිකළ ඉංගිරිසි යටත්විජිතවාදීන් ය. මෙරට අද උතුරේ සිටින දෙමළ ජනයා ලන්දේසින් විසින් දුම්කොළ වගාව සඳහා කෝරමණ්ඩල වෙරළින් ගෙන්වනු ලැබූ දෙමළ ජනයාගෙන් එවකටත් උතුරේ සිටි සිංහල ජනයාගෙන් හා මලයාලම් කතාකළ සුළු පිරිසකගෙන් පැවත එන්නන් බව අපි නිර්භයව ම කියමු. ඒ අයුරින් ගත්කල මෙරට දෙමළ ජනයාගේ ඉතිහාසය 1650න් ඈතට නො යයි. මෙරට දෙමළ ජාතිවාදය බිහිකර එය පෝෂණය කළෝ ලන්දේසිහු හා ඉංගිරිසිහු වෙති. මේ පිළිබඳ විස්තර ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා යන කෘතියෙහි ද ඉරිදා දිවයින, විදුසර හා අයිලන්ඩ් පුවත්පත්වලට ලියන ලද ලිපිවල අඩංගු වෙයි. ඒ බොහෝමයක් කාලය වෙබ් අඩවියෙන් (ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව් ඩොට් කාලය ඩොට් ඕර්ග්) බාගත හැකි ය.

සම්බන්ධන් ප්‍රසිද්ධියේ ම ඉලංකෙයි තමිල් අරසු කච්චි යන පක්ෂය නැවතත් ඉදිරියට ගෙන ඇත. රූපවාහිනියේ පඬියෝ කච්චි යන්න පමණක් සිංහලට පරිවර්තනය කර ඉලංකෙයි තමිල් අරසු පක්ෂය යනුවෙන් උණ විකාරයෙන් පඬිකම ප්‍රදර්ශනය කරති. ඉලංකෙයි තමිල් අරසු යනු ලංකා දෙමළ රාජ්‍ය බව ඔවුන්ට අමතක වී ද? ඔවුන් යන්න සිංහල ක්‍රමයට උච්චාරණය කළ නොහැකි නිවේදකයන් සිටින රූපවාහිනියෙහි (ඔවුන් යන්නෙහි ඔ යන්න ශබ්ද කෙරෙන්නේ ඉංගිරිසියෙන් ඔරෙන්ජ් යන්නෙහි ඔ ශබ්ද කරන ආකාරයට ය) පඬියෝ හා අනුකාරකයෝ පඬිබව ප්‍රකාශ කිරීමට වෑයම් කරති. සම්බන්ධන්ලාගේ දේශපාලනයෙහි අවසානය වෙන ම දෙමළ රාජ්‍යයක් පිහිටුවීම ය. මොවුහු චෙල්වනායගම්ගේ “දැන් ටිකක් පසුව බොහෝ” යන ප්‍රතිපත්තිය අනුගමනය කරති. සම්බන්ධන් ජී ජී පොන්නම්බලම්ගේ දෙමළ කොංග්‍රසයෙන් ඊනියා ෆෙඩරල් පක්ෂයට සම්බන්ධ වූවෙකි. මොවුන්ගේ තර්කය මෙසේ ය. පෘතුගීසීන් මෙරටට පැමිණෙන විට මෙරට ස්වාධීන රාජ්‍ය කිහිපයක් විය. ඉන් එකක් යාපනය රාජ්‍යය. මෙරට දෙමළ ජනයා අවුරුදු දහස් ගණනක් දෙමළ නිජභූමි වූ උතුරු හා නැගෙනහිර පළාත්වල ජීවත් වී ඇත. ඉංගිරිසිහු ආපසු යද්දී සිංහලයන්ට නිදහස දී දෙමළ ජනයා සිංහලයන් යටතට පත්කළහ. සිංහලයන් යටතේ දෙමළ ජනයාට අසාධාරණකම් සිදුවෙයි. එයට විරුද්ධව දෙමළ ජනයා කළ සාමකාමී සටන්වලට සිංහල ආණ්ඩු පහර දුන්හ. වෙන්වීම හැරෙන්නට දැන්කළ හැකි දෙයක් නැත. මේ තර්කාවලියෙහි ඇතැම් තැන් අද සම්බන්ධන් නොපිලිගන්නවා ඇත. එහෙත් හරය අතින් එහි වෙනසක් නැත. බොරු ඉතිහාසයක් මත පදනම්ව බොරු අසාධාරණකම් ගැන කතාකරමින් දෙමළ ජාතිවාදය කරන මේ නෙයියාඩම දැන් නැවැත්විය යුතු ය. කෙසේ වෙතත් ප්‍රභාකරන් පරාජය කිරීමත් සමග මේ සමස්ත දේශපාලනය පරාජය කෙරී ඇත. එදා පරාජය කෙරුණේ දෙමළ ත්‍රස්තවාදය පමණක් නො වේ. එයට පදනම් වූ දෙමළ බෙදුම්වාදී දේශපාලනය ද පරාජය විය. අද සම්බන්ධන්ට නැවතත් ඒ දේශපාලනය ආරම්භකිරීමට ඉඩදිය යුතු නො වේ. දෙමළ ජාතිකත්වය සිංහල ජාතිකත්වය මෙන් නොව උඩ සිට පහළට ක්‍රියාත්මක වෙයි. ජාතිකත්වය පිලිබඳ තීරණ ගැනෙන්නේ නායකයන් අතිනි. එහෙත් අද දෙමළ ජනයාට නායකත්වයක් නැත. සම්බන්ධන්ලා දන්නේ ගහ වටේ දිවීමට පමණ ය. ඩග්ලස් දේවානන්දට යාපනයේ ජනයාට දිය හැකි නායකත්වයක් නැත. කරුණා අම්මාන් ශ්‍රී ල නි ප නායකත්වය පිළිගනියි. උතුරේ හා නැගෙනහිර ජනතාව උතුරු වසන්තයට හා නැගෙනහිර උදානයට ආකර්ෂණය වෙමින් සිටිති. දෙමළ ජනයා මෙවර ජාතික අවුරුදු උත්සවය වෙනදාට වඩා සරුවට පැවැත්වූහ. මුස්ලිම් ජනයා ද එයට එකතුකර ගත යුතු ය. අද අපට ප්‍රාදේශීය අනන්‍යතා ආරක්ෂා කරගනිමින් පොදු සංස්කෘතියක් නිර්මාණය කිරීමේ අවස්ථාව උදා වී ඇත. එයට ශ්‍රී ල නි ප නායකත්වය දිය යුතු ය. සිංහල විරෝධී දෙමළ ජාතිවාදයට ඉඩ නොදී දෙමළ ජාතිකත්වය වෙනුවෙන් ශ්‍රී ල නි පක්ෂයට කටයුතු කළ හැකි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva